*සැ. යු.*- (i) 2022.05.13 දින පළවූ අංක 2280 *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI වැනි කොටසේ 2022 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,281 - 2022 මැයි මස 20 වැනි සිකුරාදා - 2022.05.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 686 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*- (i) සවීර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 අප්‍රේල් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.
(ii) ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අප්‍රේල් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජුනි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මැයි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

685 B 082347— 403 (2022/05)
A 1-

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී - අම්බලන්ගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණුදෙනුකරුගේ නම : කන්ට්‍රි කිචන් කන්ෆෙක්ෂනරි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2021.02.25 වැනි දින විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව වර්ෂ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, කන්ට්‍රි කිචන් කන්ෆෙක්ෂනරි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායි /උකස්කරු ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මයාදුන්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.05.06 දිනැති අංක 743 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2016.04.06 දිනැති අංක 1012 දරන අතිරේක උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 743 සහ 1012 දරන උගස් බැඳුම්කරයන් මත ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දින තෙක් වර්ෂ 2021.02.04 වැනි දින වන විට රුපියල් පන් මිලියන අට ලක්ෂ හැත්තෑ හත් දහස් අටසිය පනස් නවයයි ශත විස්ස (රු. 5,877,589.20)ක මුදලක් සමග රු. 5,791,796.34ක මුදල මත වර්ෂ 2021.02.05 දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු වර්ෂයකට 17.5% බැගින් පොළිය ද, සහ රුපියල් හය මිලියන තුන් ලක්ෂ අටදහස් දෙසිය හැත්තෑ පහයි ශත පනස් දෙකක (රු. 6,318,275.52)ක මුදලක් සමග රු. 6,036,969.44ක මුදල මත වර්ෂ 2021.02.05 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු වර්ෂයකට 17.5% බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 743 සහ 1012 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් දොළොස් මිලියන එක් ලක්ෂ අනූ හය දහස් එකසිය තිස් හතරයි ශත හැත්තෑ දෙක (රු. 12,196,134.72)ක මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ කන්ට්‍රි කිචන් කන්ෆෙක්ෂනරි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය විසින් බැංකුව වෙත උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, (බලපිටි ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) වැල්ලබොඩ පත්තුවේ, බලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රන්දොඹේ දකුණ 88/ඒ, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රණ්දොඹේ පිහිටි "ගලගාවවත්ත මහපාරෙන් නැගෙනහිරින් කැබැල්ල" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මානක එම්. තේජසිරි විසින් සකසන ලද 2014.03.21 වැනි දිනැති අංක 1455 දරන පිඹුරෙහි නිරූපිත (බලයලත් මානක සී. ටී. දි. එස්. මනුකුලසූරිය විසින් මැන සකසන ලද 1994.11.08 දිනැති අංක 1026 දරන පිඹුරෙහි ලොට් 2හි ලොට් A සහ ලොට් A හි ලොට් 1 හි ලොට් 1A, 1B සහ 1C හි නැවත මැන එකතු කර සකස්කරන ලද) ලොට් A යනුවෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : මුල් ඉඩමෙන් අත්හරින ලද ලොට් B සහ පන්සල්වත්ත ද, නැගෙනහිරින් : පන්සලවත්ත ද, දකුණට : ගාලු පාර ද, සහ බස්නාහිරට : අත්හරින ලද ලොට් B සහ ගාලු පාර ද මගින් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම තුනයි අට (පර්. 38.38) වූ ඉඩම සහ ඒ මත ඇති පස, ගහකොළ, වගාවන් සහ ඒ මත පිහිටි අනෙකුත් සියල්ල ද සමග වේ. මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු D 49/109 හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණී - ණය අයකර ගැනීම්.

05 - 129

---

## දැන්වීමයි

### මහජන බැංකුව - මහනුවර ශාඛාව

වෙන්දේසිකරු වෙනස් කිරීම

ටෂින් ඇන්ඩ් ඔලිව් (පුද්.) සමාගම විසින් උකස් කරන ලද දේපළ වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් 2022.05.06 දින දිනමිණ පුවත්පතෙහි පළ කරන ලද දැන්වීමේ සඳහන්, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.10.29 දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙන් පත් කරන ලද වෙන්දේසිකරු වූ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම වෙනුවට බලයලත් වෙන්දේසිකාර ප්‍රේමසිරි වඩුගේ මහතා පත්කිරීම 2022.04.29 දින මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඒකමතිකව අනුමත කර ඇති බව මෙයින් දන්වමු.

ප්‍රාදේශීය කළමනාකාර,

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
17, දළදා වීදිය,
මහනුවර.

05-145